# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2316/13 - 2023 ජනවාරි මස 24 වැනි අඟහරුවාදා - 2023.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත**

2022 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් අවසන් වරට සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ (එකතු කළ අගය මත බදු පනත) 25ඇ වගන්තියේ (8) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දොන් රංජිත් සිසිරකුමාර හපුආරච්චි වන මම, මෙම නියෝගය මගින් එම වගන්තියේ කාර්යය සඳහා මූල්‍ය සේවාවන් සැපයීම මත එකතු කළ අගය මත බද්දට (මින් මතු මූල්‍ය සේවාවන් සැපයීම මත එ. අ. බ. යනුවෙන් හැඳින්වෙන) අදාළ කරුණු හා එම බද්ද ගණනය කරනු ලබන ආකාරය, උපලේඛනයේ සඳහන් පරිදි නිශ්චය කරමි.

මෙම නියෝගය 2022 ඔක්තෝබර් මස 01 වන දින සිට බල පැවැත්වෙන අතර 2014 ජූනි මස 23 වන දින සහ අංක 1868/10 දරන ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග, මෙම ගැසට් නිවේදනය ක්‍රියාත්මක වන දින සිට පරිච්ඡින්න කරනු ලැබේ.

දොන් රංජිත් සිසිරකුමාර හපුආරච්චි,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2023 ජනවාරි මස 23 වැනි දින,
දේශීය ආදයම් දෙපාර්තමේන්තුව,
කොළඹ 02.

උපලේඛනය

1. මූල්‍ය සේවා සැපයීම මත එකතු කළ අගය මත බද්දේ කාර්යය සඳහා මුළු එකතු කළ අගය ගණනය කිරීම

(අ) එකතු කළ අගය මත බදු පනතේ 25ඇ (1) වගන්තිය ප්‍රකාර, සියළු ලියාපදිංචි ආයතන හෝ යම් තැනැත්තෙකු පිළිගත් ගණකාධිකරණ ප්‍රමිත (බදු අය කළ හැකි කාල සීමාවට අදාළව) අනුව ගණන් බලන ලද ලාභය මත ආදායම් බදු ගෙවීමට ප්‍රථම අවස්ථාවෝචිත පරිදි, ශුද්ධ ලාභය හෝ පාඩුව ඇතුලත්ව හා ආර්ථික ක්ෂය, [පහත (ආ) ඡේදයේ දක්වා ඇති පරිදි ගණනය කරන ලද] ආයතනයේ සියළුම සේවා නියුක්තිකයන්ට ගෙවිය යුතු පඩිනඩි හා එකතු කළ අගය මත බදු පනතේ III අ පරිච්ඡේදය යටතේ වූ මූල්‍ය සේවා සැපයීම මත එකතු කළ අගය මත බද්ද හා 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ දෙවන උපලේඛනයේ 3 වන අයිතමයේ (අ) අනු අයිතමය යටතේ වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගැලපීමට යටත්ව බදු අය කළ හැකි කාල සීමාව සඳහා ගණනය කරන ලද මුළු එකතු කළ අගය මත බදු ගෙවීමට යටත් වේ.

[2012.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී.මූ.වා.ප්‍ර) (SLFRS) වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු යම් නිශ්චිත ආයතනයක් හෝ යම් තැනැත්තෙකු ඉහත කාර්යය සඳහා ශ්‍රී.මූ.වා.ප්‍ර. අනුව වූ මෙහෙයුම් ලාභය සැලකිල්ලට ගත යුතුය.]

(ආ) ආර්ථික ක්ෂය

(i) අනුප්‍රමාණයන්

අමාත්‍යවරයා විසින් නිශ්චය කරන ලදුව 2009.06.19 දිනැති 1606/36 දරන ගැසට් නිවේදනයෙහි පළ කරන ලද ආර්ථික ක්ෂය අනුප්‍රමාණයන් පහත සඳහන් වේ.

| *වත්කම* | *අනුප්‍රමාණය (වාර්ෂිකව)* |
|---|---|
| පරිගණක මෘදුකාංග ඇතුළුව දත්ත සැකසීමේ උපකරණ හා උපාංග | 25% |
| මෝටර් රථ | 20% |
| අනෙකුත් යන්ත්‍ර සූත්‍ර, පිරියත, උපකරණ, ගෘහභාණ්ඩ හෝ සවිකිරීම් | 12.5% |
| අස්පෘෂ්‍ය වත්කම් (කීර්ති නාමය හැර) | 10% |
| ගොඩනැගිලි | 6 2/3% |

(ii) ආර්ථික ක්ෂය සම්බන්ධයෙන් වන ප්‍රකාශය මුළු වර්ෂය සඳහාම පිළියෙල කළ යුතුය. මෙම ක්ෂය අනුප්‍රමාණයන්, පිරිවැය සහ සරළ රේඛීය ක්‍රමය (සමාන වාරික ක්‍රමය) මත පදනම්ව අදාළ කරගනු ලැබිය යුතුය. ක්ෂය දීමනා සම්බන්ධයෙන් දේශීය ආදායම් පනත මගින් පනවනු ලබන සීමාවන් අදාල නොවිය යුතුය.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අදාළ කර ගැනීමෙන් අනතුරුව, වත්කම් වර්ගීකරණය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මත පදනම් විය යුතුය. කෙසේ වුවද, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අදාළ කර ගැනීමට පෙර අත්පත් කර ගන්නා ලද යම් වත්කමකට අදාළව මීට පෙර අනුගමනය කරන ලද වර්ගීකරණය, ආර්ථික ක්ෂය ගණනය කිරීමේදී තවදුරටත් යොදා ගනු ලැබිය යුතුය.

(iii) 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත හෝ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ලියාපදිංචි යම් තැනැත්තෙකුගේ එකී පනත්වල විධිවිධාන යටතේ කල්බදුකරණය කරන ලද වත්කමක් මත ආර්ථික ක්ෂය දීමනා ඉඩ දෙනු නොලැබේ.

(ඇ) "ගෙවිය යුතු පඩි නඩි" යන්නෙන් සියළු සේවා නියුක්තිකයන්ට ගෙවිය යුතු දළ පාරිශ්‍රමිකය අදහස් වේ.

"දළ පාරිශ්‍රමිකය" යන්නෙන් සේවා නියුක්තිකයන්ට ගෙවනු ලබන මුදල්මය ප්‍රතිලාභ සහ මුදල්මය නොවන ප්‍රතිලාභයන්හි එකතුව අදහස් වන අතර එයට මෙහෙයුම් ලාභය ගණනය කිරීමේදී ආදායම් ප්‍රකාශයට අය කරනු ලබන සේවාන්ත ප්‍රතිලාභ වලට අදාළ යම් ගෙවීමක්, දායක මුදලක් හෝ ප්‍රතිපාදනයක් ඇතුළත් වේ.

(ඈ) මුළු එකතු කළ අගය

| | | | |
|---|---|---|---|
| ශුද්ධ ලාභය හෝ පාඩුව (ආදායම් බදු වියදමට පෙර) | | | xxx |
| එකතු කළා : | ආදායම් ප්‍රකාශනයට අය කරන ලද මූල්‍ය සේවා සැපයීම මත එ.අ.බද්ද හා ස.ආ.දා. බද්ද | xx | |
| | ආදායම් ප්‍රකාශනයට අයකරන ලද ක්ෂය | xx | |
| | ගෙවිය යුතු පඩි නඩි | xx | xxx |
| | | | xxx |
| අඩු කළා : | ආර්ථික ක්ෂය | | (xx) |
| | බදු අය කිරීමට පෙර මුළු එකතු කළ අගය | | xxx |
| අඩු කළා : | එ. අ. බ. පනතේ III අ පරිච්ඡේදයට අනුව ගෙවිය යුතු මූල්‍ය සේවා සැපයීම මත එ. අ. බද්ද | | (xx) |
| | ස. ආ. දා. බදු පනතේ දෙවන උපලේඛනයේ 3 වන අයිතමයේ (අ) අනු අයිතමය යටතේ වූ ස. ආ. දා. බද්ද | | (xx) |
| මුළු එකතු කළ අගය | | | xxx |

[ගෙවිය යුතු බද්ද - එකතු කළ අගය මත බදු පනතේ 25ඈ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය යටතේ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ 3 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති, අනුප්‍රමාණය යටතේ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද]

(02). මූල්‍ය සේවා සැපයීම මත එකතු කළ අගය මත බද්ද ගණනය

(අ) යම් ලියාපදිංචි තැනැත්තෙකු මූල්‍ය සේවා සැපයීම සහ, ශ්‍රී ලංකාවෙන් පිටත සලසනු ලබන මූල්‍ය සේවා හෝ 25ඈ (5) වගන්තිය යටතේ සඳහන් කටයුතු සඳහා (මෙහි මින් මතු මූල්‍ය නොවන සේවා යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනම ගිණුම් පිළියෙල කොට පවත්වාගෙන යනු ලබන්නේ නම් සහ එම ගිණුම් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 120 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ගණකාධිකාරීවරයෙකු විසින් සහතික කරනු ලබන්නේ නම්, එවිට එකී කටයුතු වල එකතු කළ අගය වෙනම ගණනය කළ යුතුය.

(ආ) එකතු කළ අගය මත බදු පනතේ III අ පරිච්ඡේදය යටතේ එකතු කළ අගය මත බදු ගෙවීමට යටත්වන යම් ලියාපදිංචි තැනැත්තෙකු, මූල්‍ය නොවන සේවා සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන යනු නොලබන්නේ නම්, එවැනි තැනැත්තෙකු මූල්‍ය සේවා සැපයුම මත අගය එකතු කිරීම අනුපාතික පදනම මත ගණනය කළ යුතුය. එම කාර්යය සඳහා, ලාභ ගණනය කිරීමේ කාර්යය සඳහා සහ පිරිවැටුම ගණනය කිරීමේ කාර්යය සඳහා හඳුනාගන්නා ලැබීම් වල සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබේ නම්, යම් මාසයක මූල්‍ය නොවන සේවාවන්ගේ පිරිවැටුම එම මාසයේ මුළු පිරිවැටුමට දරන අනුපාතයම, මූල්‍ය සේවා මත ආරෝපිත අගය වැඩිවීම, මුළු අගය වැඩිවීමට දරන අනුපාතය ලෙස සැලකිය යුතුය.

මූල්‍ය සේවා සැපයීම මත ආරෝපිත එකතු කළ අගය ගණනය කිරීම පහත සඳහන් පරිදි විය යුතුය.

$$\begin{array}{c}\text{මූල්‍ය සේවා සැපයීම මත}\\ \text{ආරෝපිත එකතු කළ අගය}\end{array} = \begin{array}{c}\text{මුළු එකතු}\\ \text{කළ අගය}\end{array} - \left\{ \begin{array}{c}\text{මුළු එකතු}\\ \text{කළ අගය}\end{array} \times \frac{\text{මූල්‍ය නොවන සේවා සැපයීම මත පිරිවැටුම}}{\text{ආදායම් ප්‍රකාශනය අනුව මුළු පිරිවැටුම}} \right\}$$

[මුළු එකතු කළ අගය යන්නෙන් උපලේඛනයේ අයිතම (01)(ඇ) යටතේ ගණනය කරන ලද මුළු එකතු කළ අගය අදහස් වේ.]

(03). වාර්ෂික වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන

25ආ වගන්තියෙහි සඳහන් වාර්තාව ඉදිරිපත් කිරීම සම්පූර්ණ වීම සඳහා පනතේ 25ඈ (1) වගන්තියෙහි සඳහන් ගැලපීම සමඟ පහත ලිපිලේඛන ඉදිරිපත් කළ යුතුය.

(අ) අදාළ කාල පරිච්ඡේදය සඳහා විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය.
(ආ) අදාළ කාල පරිච්ඡේදය සඳහා විස්තරාත්මක ලාභ අලාභ ගිණුම.
(ඇ) ගෙවිය යුතු පඩිනඩි වලට අදාල උපලේඛනයක්.
(ඈ) ආර්ථික ක්ෂය සම්බන්ධයෙන් උපලේඛනයක්.
(ඉ) පනතෙහි 21 වන වගන්තිය අනුව අදාළ කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කළ යුතු එකතු කළ අගය මත බදු වාර්තාවේ ප්‍රකාශිත සැපයුම් වටිනාකම බෙදුණු ආකාරය.
(ඊ) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව මූල්‍ය ප්‍රකාශය මත පිරිවැටුම සැසඳුම.

| *අයිතමය* | *පහත සඳහන් කාර්යයන් ගණනය කිරීම සඳහා අදාළ පිරිවැටුම* | | | *මූල්‍ය ප්‍රකාශය අනුව මුළු පිරිවැටුම* | *කල්බදු වාරිකයන්හි ප්‍රාග්ධන කොටස* |
|---|---|---|---|---|---|
| | *පනතෙහි 2 වන වගන්තිය අනුව ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද* | *පනතෙහි 25(අ) වගන්තිය අනුව ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද* | *මූල්‍ය නොවන කටයුතු සඳහා ආරෝපිත එකතු කළ අගය* | | |
| | | | | | |
| එකතුව | | | | | |



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.